SRI LANKA

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

## අදියර III විභාගය - 2026 ජූලි

## යෝජිත උත්තර

# (3801) මූල්‍ය වාර්තාකරණය (FAR)


**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

නො. 540 , පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි මාවත,

නාරාහේන්පිට, කොළඹ 05.

දුරකථන : 011-2-559 669



**මෙය අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශයේ ප්‍රකාශනයකි**

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# අදියර 03 විභාගය - 2026 ජූලි

# (3801) මූල්‍ය වාර්තාකරණය

# යෝජිත උත්තර

| අනිවාර්ය ප්‍රශ්න 4<br>(මුළු ලකුණු 20) | **A කොටස** |
|---|---|

## *පළමුවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :*

**(a)** **අදාළත්වය**

යම් තොරතුරකට තීරණයක් ගැනීම වෙනස් කළ හැකිනම්, එම තොරතුර අදාළ තොරතුරක් ලෙස සලකනු ලබයි. අදාළත්වය යන්න තොරතුරක පුරෝකථන අගය, තහවුරු කිරීමේ අගය සහ ප්‍රමාණාත්මකභාවය මත පදනම් වේ.

**විශ්වසනීය නිරූපණය**

මූල්‍ය වාර්තා මගින් ආර්ථික සිදුවීම් වචන සහ සංඛ්‍යා මගින් නිරූපණය කළ යුතුය. තොරතුරක විශ්වසනීය නිරූපණය තහවුරු වන්නේ එය සම්පූර්ණත්වය, අපක්ෂපාතීත්වය/මධ්‍යස්ථබව සහ දෝෂ වලින් තොර වූ විටය.

***(ලකුණු 03 යි)***

**(b)**

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලබන්නේ, ව්‍යාපාරය අපේක්ෂා කළ හැකි අනාගත කාලය තුළ දිගටම ක්‍රියාත්මක වනු ඇතැයි යන අඛණ්ඩ පැවැත්ම පිළිබඳ උපකල්පනය මතය.
එබැවින්, එම ආයතනය වසා දැමීමට හෝ එහි මෙහෙයුම්වල පරිමාණය සැලකිය යුතු ලෙස අඩු කිරීමට අදහසක් හෝ අවශ්‍යතාවක් නොමැති බව උපකල්පනය කරනු ලැබේ.

ඒ අනුව, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සඳහන් වත්කම් සහ වගකීම් ජංගම සහ ජංගම නොවන ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

***(ලකුණු 02 යි)***
***(මුළු ලකුණු 05)***

## *දෙවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :*

**(a)**

- සංවිධානයේ අතීත කාර්යසාධනය පිළිබඳ තොරතුරු පාර්ශ්වකරුවන්ට ලබා දීම සහ පාරිසරික, සමාජීය හා පාලන (ESG) වැඩසටහන් සම්බන්ධයෙන් අනාගත දැක්මක් ලබා දීම.
- නීති, ප්‍රමිතීන් සහ කාර්යසාධන ප්‍රමිතීන්ට අදාළව තිරසාර කාර්යසාධනය මැනීම සහ ඇගයීම.
- සංවිධානයක් තිරසාර සංවර්ධනය පිළිබඳ අපේක්ෂාවන්ට බලපාන ආකාරය සහ එම අපේක්ෂාවන් සංවිධානයට බලපාන ආකාරය පෙන්වීම.
- කාලයත් සමඟ සහ විවිධ සංවිධාන අතර කාර්යසාධනය සංසන්දනය කිරීම.
- සංවිධානයේ පාරිසරික, සමාජීය හා පාලන (ESG) බලපෑම් පිළිබඳව සන්නිවේදනය කිරීම.
- විනිවිදභාවය සහ වගවීම වැඩි දියුණු කිරීම.
- පාරිසරික, සමාජීය හා පාලන (ESG) අවදානම් සහ අවස්ථා කළමනාකරණය කිරීම.

(ඉහත අරමුණු අතරින් එක් අරමුණක් පමණක් සඳහන් කිරීම ප්‍රමාණවත් වේ.)

***(ලකුණු 02 යි)***

**(b)**

- වාර්තාකරණ ඒකකය
- එකිනෙකට සම්බන්ධ තොරතුරු
- සාධාරණ ඉදිරිපත් කිරීම
- ප්‍රමාණාත්මක බව
- මාර්ගෝපදේශ ලබාගන්නා මූලාශ්‍ර
- හෙළිදරව් කිරීම් සඳහන් කරන ස්ථානය
- වාර්තා ඉදිරිපත් කරන කාලය
- සංසන්දනාත්මක තොරතුරු
- අනුකූලතාව පිළිබඳ ප්‍රකාශය
- විනිශ්චයන්, අවිනිශ්චිතතා සහ දෝෂ
- මූලික එකඟතාව
- තිරසාරභාවයට අදාළ අවදානම් සහ අවස්ථා

(ඉහත කරුණු අතරින් කරුණු 3ක් පමණක් සඳහන් කිරීම ප්‍රමාණවත් වේ.)

***(ලකුණු 03 යි)***
***(මුළු ලකුණු 05)***

## *තුන්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :*

**(a)**

- මූල්‍ය තොරතුරු වාර්තා කිරීම
- පොදු ලෙජරය පවත්වාගෙන යාම
- ලැබිය යුතු ගිණුම් කළමනාකරණය
- ගෙවිය යුතු ගිණුම් කළමනාකරණය
- වැටුප් ගෙවීම් ක්‍රියාවලිය
- තොග කළමනාකරණය

aat SRI LANKA

- බැංකු සැසඳුම්
- ශේෂ පිරික්සුම සකස් කිරීම
- මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම
- බදු කළමනාකරණය
- අයවැය සකස් කිරීම සහ පුරෝකථනය
- ඒකාබද්ධ කිරීමේ හැකියාව
- පරිශීලක ප්‍රවේශ පාලනය

(කරුණු දෙකක් පමණක් ප්‍රමාණවත් වේ)

*(ලකුණු 02 යි)*

**(b)**

**කාර්යක්ෂමතාව වැඩි කිරීම**

ගිණුම්කරණ සහ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලීන් ස්වයංක්‍රීයකරණය කිරීම මගින් මානව සම්පත් සහ ලිපිද්‍රව්‍ය සඳහා වැයවන පිරිවැය අඩු කළ හැකිය. එමගින් මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේ ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂම හා වේගවත් වන අතර, අඩු කාලයකින් නිවැරදි මූල්‍ය වාර්තා ජනනය කිරීමට හැකි වේ.

**ප්‍රමාදයන් අඩු කිරීම**

ගිණුම්කරණ ක්‍රියාවලිය ස්වයංක්‍රීයකරණය කිරීම මගින් මූල්‍ය වාර්තා පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීමේ වේගය වැඩි වේ. එම නිසා, අතින් සිදුකරන මූල්‍ය වාර්තාකරණයේදී ඇතිවන සාමාන්‍ය ප්‍රමාදයන් අඩු කළ හැකිය. මෙය තීරණ ගන්නන් හට අවශ්‍ය මූල්‍ය තොරතුරු ඉක්මනින් ලබාගෙන, වඩාත් කඩිනමින් නිවැරදි තීරණ ගැනීමට උපකාරී වේ.

**මානව දෝෂ අඩු කිරීම**

සාමාන්‍යයෙන්, අතින් සිදුකරන මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලියේදී තොරතුරු අතපසු වීම, වැරදි ලෙස සටහන් කිරීම සහ වැරදි ප්‍රකාශ කිරීම් වැනි මානව දෝෂ ඇතිවිය හැකිය. ගිණුම්කරණ ක්‍රියාවලිය ස්වයංක්‍රීයකරණය කිරීම මගින් මෙවැනි මානව දෝෂ අවම කර හෝ ඉවත් කළ හැකිය. එමගින් මූල්‍ය ප්‍රකාශන වඩාත් නිවැරදි සහ විශ්වාසදායක බවට පත් වේ.

**තත්‍ය කාලීන මූල්‍ය තොරතුරු ලබා දීම**

අතින් සිදුකරන මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලියේදී මූල්‍ය තොරතුරු අතින් සැකසීමට සිදුවන බැවින්, තොරතුරු ලබා ගැනීමට වැඩි කාලයක් ගත විය හැකිය. එහෙත්, ගිණුම්කරණ ක්‍රියාවලිය ස්වයංක්‍රීයකරණය කිරීම මගින් ව්‍යාපාරයට තත්‍ය කාලීන මූල්‍ය තොරතුරු ඉක්මනින් ලබා ගැනීමට හැකි වේ.

**වාර්තාකරණයේ ගුණාත්මකභාවය වැඩි කිරීම**

ස්වයංක්‍රීය මූල්‍ය වාර්තාකරණය මගින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සහ ඉදිරිපත් කිරීමේදී ප්‍රමිතිගතභාවය සහ අනුකූලතාව පවත්වාගෙන යා හැකිය. එමගින් මූල්‍ය වාර්තාවල නිරවද්‍යතාවය සහ විශ්වාසනීයත්වය වැඩි වන අතර, සමස්ත මූල්‍ය වාර්තාකරණයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමට හැකි වේ.

**අභ්‍යන්තර පාලනයන් වැඩිදියුණු කිරීම**

ස්වයංක්‍රීය මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය තුළ දත්ත වෙත ප්‍රවේශ වීම සහ දත්ත පද්ධතියට ඇතුළත් කිරීම සම්බන්ධ අභ්‍යන්තර පාලනයන් ඇතුළත් කළ හැකිය. තවද, රාජකාරි වෙන් කිරීම මෙන්ම සාමාන්‍ය පාලනයන් සහ යෙදුම් පාලනයන් ද පද්ධතිය තුළ ස්ථාපිත කළ හැකිය. එමඟින් දත්තවල ආරක්ෂාව, නිරවද්‍යතාවය සහ විශ්වාසනීයත්වය වැඩිදියුණු කරගත හැකිය.

**බැංකු ගිණුම් සැසඳීම් වේගවත් කිරීම**

අතින් සිදුකරන බැංකු ගිණුම් සැසඳීම් සමඟ සසඳන විට, ස්වයංක්‍රීය බැංකු ගිණුම් සැසඳීම් වඩාත් වේගයෙන් සිදු කළ හැකිය.

**ඒකාබද්ධ කිරීමේ හැකියාව ලබා දීම**

ස්වයංක්‍රීය මූල්‍ය වාර්තාකරණය මඟින් ගනුදෙනු වාර්තා කිරීම, තොග කළමනාකරණය, වැටුප් කළමනාකරණය, බැංකු කටයුතු වැනි විවිධ ක්‍රියාවලීන් එකිනෙකට ඒකාබද්ධ කිරීමට හැකියාව ලැබේ.

**පරිමාණය සහ නම්‍යශීලීභාවය**

ස්වයංක්‍රීය මූල්‍ය වාර්තාකරණ පද්ධති මඟින් වැඩිවන ගනුදෙනු ප්‍රමාණයන්, බහු ආයතන ව්‍යුහයන් සහ වෙනස්වන ව්‍යාපාර ආකෘති සඳහා පහසුවෙන් අනුවර්තනය විය හැකිය. තවද ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධති (ERP) සහ වළාකුළු පදනම් විසඳුම් (Cloud-based solutions) සමඟ ඒකාබද්ධ වීම මඟින් ව්‍යාපාරය පුළුල් කිරීමට සහ විවිධ වාර්තාකරණ රාමු හා විවිධ රටවල මූල්‍ය වාර්තාකරණ කටයුතු පහසු කිරීමට සහාය වේ.

(ප්‍රතිලාභ දෙකක් පමණක් අපේක්ෂා කෙරේ)

*(ලකුණු 03 යි)*
***(මුළු ලකුණු 05)***

## *හතරවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :*

**(a)**

- 1988 අංක 30 දරණ බැංකු පනත යටතේ බලපත්‍ර ලබා ඇති සමාගම්.
- 1962 අංක 25 දරණ රක්ෂණ පාලන පනත යටතේ රක්ෂණ ව්‍යාපාරය පවත්වාගෙන යාමට බලය ලබා ඇති සමාගම්.
- කල්බදු ව්‍යාපාරයේ නිරත සමාගම්.
- ණය සාධ්‍යකරණ සමාගම්
- 1988 අංක 78 දරණ මූල්‍ය සමාගම් පනත යටතේ බලපත්‍ර ලබා ඇති සමාගම්.
- 2021 අංක 19 දරණ සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ, ඒකක භාර ක්‍රියාත්මක කිරීමට බලපත්‍ර ලබා ඇති සමාගම්
- අරමුදල් කළමනාකරණ සමාගම්.
- 2021 අංක 19 දරණ සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ, කොටස් තැරැව්කරුවන් හෝ කොටස් වෙළඳුන් ලෙස ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට බලපත්‍ර ලබා ඇති සමාගම්
- 2021 අංක 19 දරණ සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ, කොටස්

SRI LANKA

වෙළඳපොළක් පවත්වාගෙන යාමට බලපත්‍ර ලබා ඇති සමාගම්

- 2021 අංක 19 දරන සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍ර ලත් කොටස් වෙළඳපොළක ලැයිස්තුගත සමාගම්.
- නිශ්චිත සීමාවන් ඉක්මවන ලැයිස්තුගත සමාගම්.
- රුපියල් මිලියන 500 ඉක්මවන වාර්ෂික පිරිවැටුමක් සහිත සමාගම්.
- පසුගිය මූල්‍ය වර්ෂය අවසානයේදී රුපියල් මිලියන 100 ඉක්මවන කොටස්හිමිකාර ප්‍රාග්ධනයක් පැවති සමාගම්.
- පෙර මූල්‍ය වර්ෂය අවසානයේදී රුපියල් මිලියන 300 ඉක්මවන දළ වත්කම් සහිතව පැවති සමාගම්.
- පෙර වර්ෂය අවසානයේදී බැංකු සහ වෙනත් මූල්‍ය ආයතන වෙත රුපියල් මිලියන 100 ඉක්මවන වගකීම් සහිතව පැවති සමාගම්.
- 1,000කට අධික සේවක සංඛ්‍යාවක් සිටින සමාගම්
- භාණ්ඩ විකිණීමේ හෝ සේවා සැපයීමේ නියැළී සිටින රාජ්‍ය සංස්ථා.

(කාණ්ඩ තුනක් පමණක් ප්‍රමාණවත් වනු ඇත)

***(ලකුණු 03)***

**(b)**

- සංසන්දනය කිරීමේ හැකියාව ඉහළ යාම
- විශ්වසනීයත්වය ඉහළ යාම
- විකෘති කිරීම් සඳහා ඇති ඉඩකඩ අවම වීමත් සමග නිරවද්‍යතාව ඉහළ යාම
- වඩා හොඳ තීරණ ගැනීම සඳහා කොටස් හිමියන්ට සහාය වීම
- ගිණුම්කරණ ගැටලු විසඳීම
- මූල්‍ය වාර්තාකරණයේ අඛණ්ඩතාව සහ ඒකාකාරී බව ඉහළ යාම
- මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන්නන්ට සහාය වීම
- ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පහසු වීම
- විගණකවරුන්ට සහාය වීම
- විනිවිදභාවය වැඩිදියුණු කිරීම
- ආයෝජක විශ්වාසය වැඩිදියුණු කිරීම

(වැදගත්කම් දෙකක් පමණක් බලාපොරොත්තු වේ)

***(ලකුණු 02)***

***(මුළු ලකුණු 05)***

***A කොටසෙහි අවසානය***

SRI LANKA

# පස්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :

සීමාසහිත සන් (පුද්ගලික) සමාගම
2026 මාර්තු 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

රු. '000

| | | |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්** | | |
| බදු පෙර ලාභය (බදු පසු ලාභය 1200 + බදු 450) | | 1,650 |
| +/- ගැලපීම් | | |
| යන්ත්‍ර ඉවත් කිරීමේ අලාභය **W2** | | 300 |
| පොලී වියදම | | 175 |
| පාරිතෝෂික වියදම **W3** | | 320 |
| ක්ශය **W2** | | 3,100 |
| මෙහෙයුම් ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් මුදල් ප්‍රවාහය | | 5,545 |
| (-) පාරිතෝෂික ගෙවීම | | (250) |
| (-)බදු ගෙවීම **W1** | | (400) |
| | | 4,895 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම** | | |
| තොගවල වැඩිවීම | (700) | |
| වෙළඳ සහ වෙනත් ලැබිය යුතු මුදල්වල වැඩිවීම | (400) | |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු මුදල්වල වැඩිවීම | 280 | (820) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වු ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **4,075** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වු මුදල් ප්‍රවාහය** | | |
| යන්ත්‍ර විකිණීමෙන් ලැබුණු මුදල | 1,800 | |
| යන්ත්‍ර මිලදී ගැනීම W 2 | (6,500) | |
| ආයෝජන ක්‍රියාකාරකම් වල යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | (4,700) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වු මුදල් ප්‍රවාහය** | | |
| ණය ගැනීම | 1,200 | |
| ගෙවන ලද ලාභාංශ | (200) | |
| ගෙවන ලද පොලී | (175) | |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනනය වු ශුද්ධ මුදල් ප්‍රවාහය | | 825 |
| **වසර සඳහා ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **200** |
| ආරම්භක මුදල් සහ මුදල් සමාන දෑ | | 1,900 |
| **අවසාන මුදල් සහ මුදල් සමාන දෑ** | | **2,100** |

aat SRI LANKA

**පෙරවැඩ**

**W1 – වසර සඳහා වන බදු වියදම**

ගෙවිය යුතු බදු

| | | | |
|---|---|---|---|
| මුදල් | 400 | ඉ/ගෙ/ශේෂය | 900 |
| ප/ගෙ/ශේෂය | 950 | බදු වියදම | 450 |
| | 1,350 | | 1,350 |

රඳවාගත් ලාභ

| | | | |
|---|---|---|---|
| ලාභාංශ | 200 | ඉ/ගෙ/ශේෂය | 3,200 |
| ප/ගෙ/ශේෂය | 4,200 | බදු පසු ලාභය | 1,200 |
| | 4,400 | | 4,400 |

**W2 – යන්ත්‍ර ඉවත් කිරීම**

දේපල පිරියත උපකරණ

| | | | |
|---|---|---|---|
| ඉ/ගෙ/ශේෂය | 22,400 | ඉවත් කිරීමෙන් ලද ලාභය/අලාභය | 4,000 |
| මුදල් | 6,500 | ප/ගෙ/ශේෂය | 24,900 |
| | 28,900 | | 28,900 |

සමුච්චිත ක්ෂය

| | | | |
|---|---|---|---|
| ඉවත් කිරීමෙන් ලද ලාභය/අලාභය | 1,900 | ඉ/ගෙ/ශේෂය | 4,200 |
| ප/ගෙ/ශේෂය | 5,400 | ක්ෂය | 3,100 |
| | 7,300 | | 7,300 |

ඉවත් කිරීමෙන් ලැබෙන ලාභය/අලාභය

| | | | |
|---|---|---|---|
| යන්ත්‍ර | 4,000 | සමුච්චිත ක්ෂය | 1,900 |
| | | මුදල් | 1,800 |
| | | ලාභ/අලාභ | 300 |
| | 4,000 | | 4,000 |

**W3 – පාරිතෝෂික වියදම**

පාරිතෝෂික සඳහා වෙන්කිරීම

| | | | |
|---|---|---|---|
| මුදල් | 250 | ඉ/ගෙ/ශේෂය | 380 |
| ප/ගෙ/ශේෂය | 450 | පාරිතෝෂික වියදම | 320 |
| | 700 | | 700 |

***(මුළු ලකුණු 10)***

## *හයවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :*

**පරිච්ඡේදය**

***(A)***

රු. '000

| **කාර්යය සාධන බැඳීම්** | **තනි මිල ගණන්** | **ගනුදෙනු මිල වෙන් කිරීම** | **ගිවිසුම් මිල** | **2025/26 වර්ෂය සඳහා අයභාරය** | **2026/27 වර්ෂය සඳහා අයභාරය** |
|---|---|---|---|---|---|
| අවශ්‍යතාවය පරිදි සකසන ලද මෘදුකාංග (විශේෂිත) | 2,700 | 2,700/3,600 X 3,000 = 2,250 | 2,250 | ස්ථාපනය කරන අවස්ථාවේදී හඳුනාගත් ආදායම 2,250 | අදාල නැත |
| තාක්ෂණික සහාය සේවා | 25 X 36 = 900 | 900/3,600 X 3,000 = 750 | 750 | වසර 03ක කාලය තුළ ලැබුණු සේවා ආදායම (750/3) 250 | වසර 03ක කාලය තුළ ලැබුණු සේවා ආදායම (750/3) 250 |
| එකතුව | 3,600 | 3,000 | 3,000 | 2,500 | 250 |

*2026.03.31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා හඳුනාගත යුතු අයභාරය* **= 2,500,000**

*2027.03.31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා හඳුනාගත යුතු අයභාරය* **= 250,000**

***(ලකුණු 05)***

***(B)***

**ප්‍රාග්ධනිත කල යුතු ණයගැනුම් පිරිවැය**

| | රු. '000 | රු. '000 |
|---|---|---|
| **A ණය (විශේෂිත ණය)** | | |
| ණය ප්‍රමාණය | 20,000 | |
| පොලී අනුපාතය | 10% | |
| කාල සීමාව (1/7/25 – 31/3/26) | 9/12 | |
| පොලී වියදම (20,000 X 10% X 9/12) | 1,500 | |
| (-)පොලී ආදායම | (400) | |
| විශේෂිත ණය මගින් ලැබෙන ශුද්ධ පොලිය | | 1,100 |
| **B ණය (පොදු ණය)** | | |
| ණය ප්‍රමාණය | 40,000 | |
| පොලී අනුපාතය | 12% | |
| කාල සීමාව (1/7/25 – 31/3/26) | 9/12 | |
| පොදු ණය වෙනුවෙන් දරන දළ පොලී වියදම (40,000 X 12% X 9/12) | | 3,600 |
| ප්‍රාග්ධනිත කල යුතු ණයගැනුම් පිරිවැය | | 4,700 |

***(ලකුණු 05)***

***(මුළු ලකුණු 10)***

aat SRI LANKA

## *හත්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :*

**(a)**

| **විස්තරය** | **ඉඩම්** | **මෝටර් රථ** | **පාරිතෝෂික** | **එකතුව** |
|---|---|---|---|---|
| ගිණුම්කරණ ධාරණ අගය | 120,000 | 60,000 | (12,000) | 168,000 |
| (-)බදු පදනම **W1 හා W2** | (120,000) | (50,000) | - | (170,000) |
| **(a) තාවකාලික වෙනස්කම්** | - | 10,000 | (12,000) | (2,000) |
| බදු අයකල හැකි / අඩුකල හැකි තාවකාලික වෙනස්කම් | N/A | බදු අයකල හැකි තාවකාලික වෙනස්කම් | බදු අඩුකලහැකි තාවකාලික වෙනස්කම් | බදු අඩුකලහැකි තාවකාලික වෙනස්කම් |
| බදු අනුපාතය | | | | 30% |
| **(b) අවසාන විලම්භිත බදු වත්කම** | | | | 600 |

**W1 –** ඉඩම් හා මෝටර් රථ වල බදු පදනම

| **විස්තරය** | **ඉඩම්** | **මෝටර් රථ** |
|---|---|---|
| පිරිවැය | 120,000 | 90,000 |
| (-)සමුච්චිත ප්‍රාග්ධනිත දීමනාව | - | (40,000) |
| බදු පදනම | 120,000 | 50,000 |

**W2 –** පාරිතෝෂික වල බදු පදනම

| **විස්තරය** | **පාරිතෝෂික** |
|---|---|
| ධාරණ අගය | 12,000 |
| (-) වගකීම පියවනු ලබන විට බදු සඳහා අඩු කළ හැකි මුදල | (12,000) |
| බදු පදනම | - |

***(ලකුණු 05)***

**(b)**

**ගලපන සිදුවීම්**

මෙම ප්‍රසාද දීමනාව 2026 මාර්තු 31 වන දිනෙන් අවසන් වන වර්ෂයේ ලාභයෙන් ගෙවනු ලබන අතර, සමාගම විසින් ප්‍රසාද දීමනා ගෙවීම සාමාන්‍ය පිළිවෙතක් ලෙස පවත්වාගෙන ගොස් ඇත. එබැවින්, 2026 මාර්තු 31 වන විට ඒ සම්බන්ධයෙන් සම්මුතික බැඳීමක් නිර්මාණය වී ඇත. ඒ අනුව, 2026 අප්‍රේල් 5 වන දින අධ්‍යක්ෂවරුන් විසින් අනුමත කරන ලද ප්‍රසාද දීමනා ගෙවීම ගලපන සිදුවීමක් ලෙස සැලකේ.

**ගලපන සිදුවීම්**

මෙම වංචාව 2026 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ සිදුවී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය වාර්තා අනුමත කිරීමට පෙර, එනම් 2026 මැයි 10 වන දින එය අනාවරණය විය. එබැවින්, අදාළ තත්ත්වය වාර්තාකරණ කාලසීමාව තුළම පැවතිණි. ඒ අනුව, මෙය ගලපන සිදුවීමක් වන අතර, 2026 මාර්තු 31 දිනට අදාළ මූල්‍ය වාර්තාවලදී අතිශයෝක්තියෙන් දැක්වූ තොග අගය ඒ අනුව ගැලපිය යුතුය.

2026 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශනවල තොගය අධි තක්සේරු වීම සඳහා අවශ්‍ය ගැළපීම සිදු කළ යුතුය. ***(ලකුණු 05)***

***(මුළු ලකුණු 10)***

***B කොටසෙහි අවසානය***

## අටවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :

පරිච්ඡේදය 03

(a)

**සීමාසහිත Oceanic Cement පොදු සමාගම**
**2026 මාර්තු 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**
**ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය**

රු. '000

| | | |
|---|---|---|
| විකුණුම් | | 720,000 |
| අඩුකලා : විකුණුම් පිරිවැය (520,000 + 3,600) | | (523,600) |
| **දළ ලාභය** | | **196,400** |
| වෙනත් ආදායම් (W-2) | | 5,625 |
| **අඩු කලා- වියදම් :** | | |
| බෙදාහැරීම් වියදම් (W-3) | 37,950 | |
| පරිපාලන වියදම් (W-4) | 75,850 | |
| මූල්‍ය වියදම් (W-5) | 6,540 | (120,340) |
| **බදු පෙර ලාභය** | | **81,685** |
| ආදායම් බදු | | (9,250) |
| **බදු පසු ලාභය** | | **72,435** |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | - |
| **මුළු විස්තීර්ණ ආදායම්** | | **72,435** |

*(ලකුණු 10)*

(b)

**සීමාසහිත Oceanic Cement පොදු සමාගම**
**2026 මාර්තු 31 දිනට**
**මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

රු. '000

| | | |
|---|---|---|
| **වත්කම්** | | |
| **ජංගම නොවන වත්කම්** | | |
| **දේපල, පිරියත, සහ උපකරණ** | | 183,200 |
| **ජංගම වත්කම්** | | |
| තොගය | 91,400 | |
| වෙළඳ ලැබිය යුතු දෑ (88,000 – 1,500 - 8,650) | 77,850 | |
| ලැබිය යුතු පොලී | 125 | |
| මුදල් හා මුදල් සමාන දෑ | 19,357 | 188,732 |
| **මුළු වත්කම්** | | **371,932** |
| **හිමිකම් හා වගකීම්** | | |
| **හිමිකම්** | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 250,000 | |
| රඳවාගත් ඉපැයුම් | 75,435 | 325,435 |

| | | |
|---|---|---|
| **ජංගම නොවන වගකීම්** | | |
| කල්බදු ණයහිමි (W-6) | 3,903.73 | 3,903.73 |
| **ජංගම වගකීම්** | | |
| වෙළඳ ගෙවිය යුතු දෑ | 33,000 | |
| කල්බදු ණයහිමි (W-6) | 1,093.27 | |
| ගෙවිය යුතු ආදායම් බදු (W-1) | 8,250 | |
| උපචිත වියදම් | 250 | 42,593.27 |
| **මුළු හිමිකම හා වගකීම්** | | **371,932** |

***(ලකුණු 08)***

**(c)**

**සීමාසහිත Oceanic Cement පොදු සමාගම**
**2026 මාර්තු 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**
**හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය**

රු. '000

| | **ප්‍රකාශිත ප්‍රාග්ධනය** | **රඳවාගත් ඉපැයුම්** | **එකතුව** |
|---|---|---|---|
| 2025.04.01 දිනට ශේෂය | 250,000 | 15,000 | 265,000 |
| ගෙවන ලද ලාභාංශ | - | (12,000) | (12,000) |
| වසරේ ලාභය | - | 72,435 | 72,435 |
| | **250,000** | **75,435** | **325,435** |

***(ලකුණු 03)***

**(d)**

**සීමාසහිත Oceanic Cement පොදු සමාගම**
**2026 මාර්තු 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**
**දේපල, පිරියත, සහ උපකරණවල වෙනස්වීම් දැක්වෙන සටහන**

රු. '000

| | **ඉඩම්** | **ගොඩනැගිලි** | **යන්ත්‍ර** | **මෝටර් රථ** | **භාවිත අයිතිය ඇති වත්කම්** | **එකතුව** |
|---|---|---|---|---|---|---|
| පිරිවැය / ප්‍රත්‍යාගණනය | | | | | | |
| 2025.04.01 දිනට | 80,000 | 60,000 | 90,000 | 22,000 | - | 252,000 |
| ඉවත්කිරීම් | - | - | (20,000) | - | - | (20,000) |
| එකතු කිරීම් | - | - | - | - | 7,000 | 7,000 |
| | **80,000** | **60,000** | **70,000** | **22,000** | **7,000** | **239,000** |
| **ක්ෂය** | | | | | | |
| 2025.04.01 දිනට | **-** | **14,000** | **30,000** | **2,000** | **-** | **46,000** |
| ඉවත්කිරීම් | - | - | (20,000) | - | - | (20,000) |
| ක්ෂය | - | 1,500 | 22,500 | 4,400 | 1,400 | 29,800 |
| | **-** | **15,500** | **32,500** | **6,400** | **1,400** | **55,800** |
| **2026.03.31 දිනට ධාරණ අගය** | | | | | | **183,200** |

aat SRI LANKA

පෙරවැඩ

**(W-1) වත්කම් ඉවත් කිරීමේ ගිණුම**

| | |
|---|---|
| පිරිවැය | 20,000 |
| ලාභාලාභ | 2,000 |
| | 22,000 |
| මුදල් | 2,000 |
| සමුච්චිත ක්ෂය | 20,000 |
| | **22,000** |

**(W-2) වෙනත් ආදායම් ගිණුම**

| | |
|---|---|
| ශේෂ පිරික්සුම | 3,500 |
| ඉවත්කිරීම් මත ලාභය (W-1) | 2,000 |
| පොලී ආදයම් | 125 |
| | **5,625** |

**(W-3) බෙදාහැරීම් වියදම් ගිණුම**

| | |
|---|---|
| ශේෂ පිරික්සුම | 28,000 |
| ක්ෂය - භාවිත අයිතිය සහිත වත්කම් | 1,400 |
| ක්ෂය – මෝටර්රථ | 4,400 |
| බොල්ණය | 1,500 |
| අඩමාණ ණය වෙන්කිරීම (8,650 – 6,000) | 2,650 |
| | **37,950** |

**(W-4) පරිපාලන වියදම් ගිණුම**

| | |
|---|---|
| ශේෂ පිරික්සුම | 51,600 |
| ක්ෂය - යන්ත්‍ර | 22,500 |
| ක්ෂය - ගොඩනැගිලි | 1,500 |
| විගණන ගාස්තු | 250 |
| | **75,850** |

**(W-5) මූල්‍ය සහ වෙනත් වියදම් ගිණුම**

| | |
|---|---|
| ශේෂ පිරික්සුම | 6,000 |
| කල්බදු පොලී | 540 |
| | **6,540** |

**(W-6) කල්බදු ණයහිමි**

| වසර | ඉ/ගෙ/ශේෂය | වාරික | පොලි | ප්‍රාග්ධන කොටස | ශේෂය |
|---|---|---|---|---|---|
| 1 | 6,000,000 | 1,543,000 | 540,000 | 1,003,000 | **4,997,000** |
| 2 | 4,997,000 | 1,543,000 | 449,730 | 1,093,270 | 3,903,730 |
| 3 | 3,903,730 | 1,543,000 | 351,336 | 1,191,664 | 2,712,066 |
| 4 | 2,712,066 | 1,543,000 | 244,086 | 1,298,914 | 1,413,152 |
| 5 | 1,413,152 | 1,543,000 | 127,184 | 1,415,816 | - |

**(W-7) ගෙවිය යුතු ආදායම් බදු ගිණුම**

| | | | |
|---|---|---|---|
| මුදල් | 7,500 | ඉ/ගෙ/ශේෂය | 6,500 |
| ප/ගෙ/ශේෂය | 8,250 | ලාභාලාභ | 9,250 |
| | | | |
| | **15,750** | | **15,750** |

***(ලකුණු 04)***
***(මුළු ලකුණු 25)***

## *නවවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :*

| පරිච්ඡේදය 04 |
|---|

**(a)**

| අනුපාතය | සූත්‍රය | 2026/03/31 වසරෙන් අවසන් |
|---|---|---|
| (i) **ජංගම අනුපාතය** | ජංගම වත්කම්: ජංගම වගකීම් | = 425,000:200,000<br>= **2.125 : 1** |
| (ii) **දළ ලාභ ආන්තිකය** | දළ ලාභය / විකුණුම් X 100 | = 400,000/1,000,000 X 100<br>= **40%** |
| (iii) **ශුද්ධ ලාභ ආන්තිකය** | බදු පසු ලාභය / විකුණුම් X 100 | = 125,000/1,000,000 X 100<br>= **12.5%** |
| (iv) **තොග නේවාසික කාලය** | සාමාන්‍ය තොගය / විකුණුම් පිරිවැය X 365 | = [(150,000 + 120,000)/2]/600,000 X 365<br>= දින 82 |
| (v) **ණයගැති එකතු කිරීමේ කාලය** | සාමාන්‍ය ණයගැති / ණයට විකුණුම් X 365 | = [(200,000 +180,000)/2]/1,000,000 X 365<br>= දින 69 |

***(ලකුණු 05)***

**(b)**

**2026 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අනුපාත විශ්ලේෂණය කර්මාන්තයේ සාමාන්‍යයන් සමඟ සංසන්දනය කිරීම පිළිබඳ සාරාංශ වාර්තාව**

**ජංගම අනුපාතය**

සීමාසහිත Moon පොදු සමාගමෙහි 2.125:1 වන ජංගම අනුපාතය, එම කර්මාන්තයේ සාමාන්‍ය අගය වන 1.8:1 ට වඩා යහපත් මට්ටමක පවතී. කර්මාන්තයේ අනෙකුත් ආයතන හා සසඳන විට Moon පොදු සමාගම විසින් යහපත් ද්‍රවශීලතා මට්ටමක් පවත්වාගෙන යන බව මෙයින් පෙන්නුම් කෙරේ. Moon පොදු සමාගම විසින් 2:1 යන සාමාන්‍ය සම්මත ජංගම අනුපාතය පවත්වාගෙන යන අතර, මෙය ඔවුන්ගේ කෙටි කාලීන මූල්‍ය බැඳීම් කළමනාකරණය කර ගැනීමට උපකාරී වනු ඇත.

**දළ ලාභ ආන්තිකය සහ ශුද්ධ ලාභ ආන්තිකය**

සීමාසහිත Moon පොදු සමාගමෙහි 40%ක දළ ලාභ ආන්තිකය, එම කර්මාන්තයේ පවතින 35%ක සාමාන්‍ය දළ ලාභ ආන්තිකයට වඩා ඉහළ අගයක් ගනී. මෙයින් පෙන්නුම් කරන්නේ Moon පොදු සමාගම විසින් පාරිභෝගිකයින්ගෙන් ඉහළ මිලක් අය කරනු ලබන බව හෝ විකුණුම් පිරිවැය කළමනාකරණය කිරීමේදී ඔවුන්ගේ කාර්යක්ෂමතාව වඩා හොඳ මට්ටමක පවතින බවයි. කෙසේ වෙතත්, Moon පොදු සමාගමෙහි ශුද්ධ ලාභ ආන්තිකය 12.5%ක් වන අතර, එය කර්මාන්තයේ පවතින 15%ක සාමාන්‍ය ශුද්ධ ලාභ ආන්තිකයට වඩා අඩු අගයකි. මෙයින් පැහැදිලි වන්නේ, දළ ලාභ

SRI LANKA

ආන්තිකයන් වඩා හොඳ මට්ටමක පැවතියද, පරිපාලන, බෙදාහැරීම්, මූල්‍ය, වෙනත් සහ බදු වියදම් වැනි ඉහළ මෙහෙයුම් වියදම් දැරීමට සමාගමට සිදුවීම හේතුවෙන් ශුද්ධ ලාභ ආන්තිකය අඩු මට්ටමක පවතින බවයි.

**තොග නේවාසික කාලය**

සීමාසහිත Moon පොදු සමාගමෙහි දින 82 ක තොග නේවාසික කාලය, එම කර්මාන්තයේ සාමාන්‍ය අගය වන දින 75 ට වඩා ඉහළ අගයක් ගනී. මෙයින් පෙන්නුම් කරන්නේ Moon පොදු සමාගමෙහි තොග අමතර සතියක් පුරා ගබඩාවේ රැඳී පවතින බවයි. මෙය දුර්වල තොග කළමනාකරණය, අලෙවි නොවන හෝ සෙමින් අලෙවි වන තොග පැවතීමේ අවදානම සහ තොග තුළ මුදල් සිරවී පැවතීම වැනි කරුණු පෙන්නුම් කරයි.

**ණයගැති එකතු කිරීමේ කාලය**

සීමාසහිත Moon පොදු සමාගමෙහි ණයගැති එකතු කිරීමේ කාලය දින 69ක් වන අතර, එය කර්මාන්තයේ සාමාන්‍ය අගය වන දින 60ට වඩා වැඩිය. මෙයින් පෙන්නුම් කරන්නේ Moon පොදු සමාගමෙහි ණයගැති එකතු කිරීමේ කාර්යක්ෂමතාවය කර්මාන්තයට සාපේක්ෂව අඩු බවයි. එමඟින් අයකරගත නොහැකි ණය ඇතිවීමේ සහ ණයගැතියන් සඳහා හානිකරණය ඇතිවීමේ අවදානම වැඩි විය හැකිය.

***(ලකුණු 05)***

***(මුළු ලකුණු 10)***

## *10 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :*

| **පරිච්ඡේදය 05** |
|---|

**(a)**

**කීර්තිනාමය ගණනය කිරීම**

| | රු. '000 | රු. '000 |
|---|---|---|
| ආයෝජනයේ සාධාරණ වටිනාකම | 90,000 | |
| පාලනයට යටත් නොවන කොටස් හිමියන්ගේ සාධාරණ වටිනාකම | 18,000 | |
| මුළු ආයෝජනය | | 108,000 |
| (-)ශුද්ධ වත්කම්වල සාධාරණ වටිනාකම | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 60,000 | |
| රඳවාගත් ඉපැයීම් | 10,000 | |
| ඉඩම්වල සාධාරණ වටිනාකම ඉහළ යාම | 7,000 | 77,000 |
| **කීර්තිනාමයේ වටිනාකම** | | 31,000 |

***(ලකුණු 04)***

**(b)**

**සීමාසහිත Galaxy පොදු සමාගම**
**2025 මාර්තු 31 වන දිනට**
**මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

| | රු. '000 | රු. '000 |
|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | |
| දේපල, පිරියත, සහ උපකරණ **W1** | 202,000 | |
| කීර්තිනාමය (+90,000-7,000+18,000-70,000-7,000) | 24,000 | |
| Star පොදු සමාගමෙහි ආයෝජනය (-90,000) | - | 226,000 |
| **ජංගම වත්කම්** | | |
| තොගය (+2,000-400) | 41,600 | |
| වෙළඳ ලැබිය යුතු දෑ | 38,000 | |
| Galaxy පොදු සමාගම වෙතින් ලැබිය යුතු මුදල (-2,000+ 5,000) | - | |
| මුදල් හා මුදල් සමාන දෑ | 21,000 | 100,600 |
| **මුළු වත්කම්** | | 326,600 |
| **හිමිකම්** | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (-60,000) | 150,000 | |
| රඳවාගත් ඉපැයුම් **W 7** | 20,680 | |
| මව් සමාගමේ කොටස් හිමියන්ට හිමි හිමිකම | 170,680 | |
| පාලනයට යටත් නොවන හිමිකම **W 8** | 16,920 | 187,600 |
| **ජංගම නොවන වගකීම්** | | |
| දිගුකාලීන ණය | 79,500 | 79,500 |
| **ජංගම වගකීම්** | | |
| වෙළඳ ගෙවිය යුතු දෑ | 52,000 | |
| Star පොදු සමාගම වෙත ගෙවිය යුතු මුදල (-3,000) | - | |
| ගෙවිය යුතු ආදායම් බදු | 7,500 | 59,500 |
| **මුළු හිමිකම හා වගකීම්** | | 326,600 |

**පෙරවැඩ 01** ඉඩමේ සාධාරණ වටිනාකම ඉහළ යාම

| | රු. '000 |
|---|---|
| ඉඩමේ සාධාරණ වටිනාකම | 75,000 |
| ඉඩමේ පොත් වටිනාකම | (68,000) |
| ඉඩමේ සාධාරණ වටිනාකම ඉහළ යාම | 7,000 |

aat SRI LANKA

**පෙරවැඩ 02 පරිපාලිත සමාගමේ ශුද්ධ වත්කම්**

| | අත්පත් කරගැනීමට පෙර | අත්පත් කරගත් පසු | වාර්තාකරණ දිනට |
|---|---|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 60,000 | - | 60,000 |
| රඳවාගත් ඉපැයුම් | 10,000 | 2,000 | 12,000 |
| | 70,000 | 2,000 | 72,000 |
| අත්පත් කර ගැනීමෙන් පසු පාලනයට යටත් නොවන කොටස් හිමියන්ට අයත් ශුද්ධ වත්කම්වල කොටස (2,000 X 20%) | - | 400 | - |

**පෙරවැඩ 03 අන්තර් සමාගම් ශේෂ හිලව් කිරීම**

| | රු. '000 |
|---|---|
| Galaxy පොදු සමාගම වෙත ගෙවිය යුතු මුදල | 5,000 |
| Star පොදු සමාගම වෙත ගෙවිය යුතු මුදල | 3,000 |
| මාර්ගස්ථ තොගය | 2,000 |

**පෙරවැඩ 04 තොග මත උපලබ්ධි නොවූ ලාභ- විකුණුම්කරු පරිපාලිත සමාගම**

| | රු. '000 |
|---|---|
| තොගය | 2,000 |
| ලාභාංතිකය (විකුණුම් මිල125 = පිරිවැය 100 + ලාභය 25) | 25% |
| උපලබ්දි නොවූ ලාභ (2,000/125 X 25) | 400 |
| මව් සමාගමට අයත් උපලබ්දි නොවූ ලාභ (400 X 80%) | 320 |
| පාලනයට යටත් නොවන හිමිකමට අයත් උපලබ්දි නොවූ ලාභ (400 X 20%) | 80 |

SRI LANKA

**පෙරවැඩ 05 කීර්තිනාමය හානිකරණය (පාලනයට යටත් නොවන හිමිකම සාධාරණ වටිනාකම මත පදනම්ව)**

| | රු. '000 |
|---|---|
| **කීර්තිනාමය හානිකරණය** | 7,000 |
| මව් සමාගමේ කීර්තිනාමය හානිකරණය (7,000 X 80%) | 5,600 |
| **පාලනයට යටත් නොවන හිමිකම** කීර්තිනාමය හානිකරණය (7,000 X 20%) | 1,400 |

**පෙරවැඩ 06 ඉඩම් ඉවත් කිරීම් මත උපලබ්දි නොවූ ලාභ (විකුණුම්කරු මව් සමාගම)**

| | රු. '000 |
|---|---|
| ඉවත් කිරීම් වටිනාකම | 15,000 |
| ධාරණ අගය | 10,000 |
| උපලබ්දි නොවූ ලාභ | 5,000 |

**පෙරවැඩ 07 ඒකාබද්ධ රඳවාගත් ඉපැයුම්**

| | | | |
|---|---|---|---|
| උපලබ්දි නොවූ ලාභ (400×80%) | 320 | ඉ/ගෙ/ශේෂය | 30,000 |
| ඉඩමේ ලාභය | 5,000 | පසු ලාභ (2,000×80%) | 1,600 |
| කීර්තිනාමය | 5,600 | | |
| ප/ගෙ/ශේෂය | 20,680 | | |
| | **31,600** | | **31,600** |

**පෙරවැඩ 08 පාලනයට යටත් නොවන හිමිකම**

| | | | |
|---|---|---|---|
| උපලබ්දි නොවූ ලාභ (400×25%) | 80 | ඉ/ගෙ/ශේෂය | 18,000 |
| කීර්තිනාමය | 1,400 | | |
| ප/ගෙ/ශේෂය | 16,920 | පසු ලාභ (2,000×20%) | 400 |
| | **18,400** | | **18,400** |

***(ලකුණු 11)***

***(මුළු ලකුණු 15)***

***C කොටසෙහි අවසානය***

aat SRI LANKA

## *Notice:*

These answers compiled and issued by the Education and Training Division of AAT Sri Lanka constitute part and parcel of study material for AAT students.
These should be understood as Suggested Answers to question set at AAT Examinations and should not be construed as the "Only" answers, or, for that matter even as "Model Answers". The fundamental objective of this publication is to add completeness to its series of study texts, designs especially for the benefit of those students who are engaged in self-studies. These are intended to assist them with the exploration of the relevant subject matter and further enhance their understanding as well as stay relevant in the art of answering questions at examination level.

SRI LANKA

*© 2021 by the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka). All rights reserved. No part of this document may be reproduced or transmitted in any form or by any means, electronic, mechanical, photocopying, recording or otherwise without prior written permission of the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)*